# සිදත්සඟරා කතුවරයා ලිංග විග්‍රහයට දක්වා ඇති නිදර්ශන පිළිබඳ විමසුමක්

*උදයංගනී කේ. ඒ.*[1]

දඹදෙණි යුගය නොහොත් 13 වන සියවසේ දී පතිරාජ හිමියන් විසින් සම්පාදනය කරන ලද සිදත්සඟරාව මූලික කොට ගනිමින් විද්වතුන් අතර ගොඩනැගුණු මතවාද රාශියකි. ඒ අතර ලිංගාධිකාරයේ විග්‍රහ වන ලිංග භේදය ද මතවාද හා ගැටලු ඇති වීමට මුල් වූ අවස්ථාවකි. ලිංගය යනු ලක්ෂණයයි. ව්‍යාකරණ ලිංගය අභාවයට යෑම නිසා අර්ථය පමණක් සැලකිල්ලට ගනිමින් පැමිණි ලිංගය සමාජ ලිංගය වන අතර එය අර්ථානුගත ලිංගය වශයෙන් ද හඳුන්වනු ලබයි. ඒ අනුව සියලු ම ශබ්ද අචේතනික හා සචේතනික වශයෙන් කොටස් දෙකකට බෙදෙන අතර එහි දී සචේතනික ශබ්ද අතුරෙන් පුරුෂවාචී ශබ්ද පුරුෂ ලිංගයටත් ස්ත්‍රීවාචී ශබ්ද ස්ත්‍රී ලිංගයටත් අයත් සේ සැලකෙයි. අචේතනික ශබ්ද අයත් වනුයේ නපුංසක ලිංග ගණයට ය. නාමපද වරනැඟීමේ රටාව පදනම් කොට ගනිමින් තීරණය කරනු ලබන ලිංග භේදය ව්‍යාකරණ ලිංගයයි. මෙහි දී කිසියම් ශබ්දයක් අර්ථයෙන් ස්ත්‍රී ලිංග වුව ද පුරුෂ ලිංග වුව ද නපුංසක ලිංග වුව ද පුරුෂ ශබ්දයක් ලෙස වරනැගේ නම් පුරුෂ ලිංගයට ද ස්ත්‍රී ශබ්දයක් ලෙස වරනැගේ නම් ස්ත්‍රී ලිංගයට ද අන්‍ය ශබ්දයක් ලෙස වරනැගේ නම් නපුංසක ලිංගයට ද අයත් වේ. පාලි, සංස්කෘත මාතෘ භාෂාවල පැවතියේ මෙම ව්‍යාකරණ ලිංගයයි. නමුත් සිංහල භාෂාවේ තිබෙනුයේ අර්ථානුගත ලිංග භේදයයි. සිදත් කතුවරයා දක්වන ලිංග විග්‍රහය සහ එයට සපයන නිදර්ශන අතර පරස්පරතාවක් පවතී. එනම්, ඔහු 'පණැත් හදත් යුත් පවසනුයේ පුම ලිඟු වේ - සහයොන් සතුන් කියලු සද වේ ඉතිරි ලිඟු නම්' යනුවෙන් ලිංග භේදය අර්ථානුගත ලිංගයට අනුව විග්‍රහ කරමින් ඒ සඳහා දක්වන නිදර්ශන ව්‍යාකරණ ලිංග යට අයත් වීම එම පරස්පරතාවට හේතුවයි. ඒ පිළිබඳ ව විමර්ශනයක යෙදීම මෙහි අරමුණ වන අතර සිදත් සඟරාව ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද සඟරා ලිපි, සංස්කරණ හා පුවත්පත් ලිපි ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද යොදා ගැනේ.

ප්‍රමුඛ පදඃ සිදත්සඟරාව, පතිරාජ හිමි, අර්ථානුගත ලිංගය, ව්‍යාකරණ ලිංගය, අන්‍ය ශබ්ද

1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය. udayangigarusinhe456@gmail.com